සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2017

### 7 - ශ්‍රේණිය

### ඉතිහාසය

නම/විභාග අංකය :- ........................................................................ කාලය: පැය 02යි.

## I පත්‍රය

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) පැරණි ශිලාලිපි වල ගෝපාල ගාම ලෙස හඳුන්වා ඇත්තේ,

(1) ගොවියන් විසූ ගම් (2) ගවයන් ඇතිකළ ජනයා විසූ ගම්

(3) ධීවරයන් විසූ ගම් (4) වෙළෙන්දන් විසූ ගම්

(02) පල්ලව රාජ්‍යයේ අගනුවර කුමක් ද?

(1) කාංචි පුරය (2) මදුරා පුරය

(3) තන්ජෝරය (4) වසද්දි පුරය

(03) අතීතයේ දී ඇතුන් පිළිබඳ කාර්යාංශයේ ප්‍රධානියා හඳුන්වා ඇත්තේ,

(1) අශ අදෙක (2) රූප අදෙක

(3) ඇති අදෙක (4) මහතු

(04) කිසියම් රටක ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන ලෝක උරුමයක් ලෙස නම් කරන ජාත්‍යන්තර සංවිධානය කුමක් ද?

(1) ලෝක පරිසර සංවිධානය (2) රතු කුරුස සංවිධානය

(3) ලෝක සෞඛ්‍ය සංවිධානය (4) යුනෙස්කෝ සංවිධානය

(05) කලා වැව ඉදි කරන ලද්දේ කුමන රජතුමා විසින් ද?

(1) මහසෙන් (2) ධාතුසේන

(3) පළමුවන සේන (4) දෙවන දාඨෝපතිස්ස

- අංක 06 සිට 10 තෙක් ප්‍රශ්න නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.

(06) සිය දියණිය තුළ ශාස්ත්‍රයේ දක්ෂයෙක් කිරීම දෙමාපිය වගකීමක් බව සහස්සවත්ථුප්‍රකරණයේ සඳහන් වේ. (...............)

(07) පළමුවන විජයබාහු රජතුමා තිලෝකසුන්දරී නම් කාලිංග වංශික කුමරියක් විවාහ කරගන්නා ලදී. (...............)

(08) ලම්බකර්ණ රජ පෙළපතේ ආරම්භකයා ධාතුසේන රජතුමා ය. (...............)

(09) රන්ගිරි දඹුලු ලෙන් විහාරය ලංකාවේ පිහිටි ලෝක උරුමයකට අයත් වේ. (...............)

(10) ක්‍රි.ව 1215 දී කාලිංග මාඝ පොළොන්නරුව ආක්‍රමණය කරන විට එහි පාලකයා වූයේ නිශ්ශංක මල්ල රජුය. (...............)

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල හිස්තැන් සඳහා සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

(11) අනුරාධපුර යුගයේ රජෙකු වූ ............................................ දිවා රාත්‍රී සිය මවට ඇප උපස්ථාන කළ බව මහා වංශයේ සඳහන් වේ. ( අටවන අග්ගබෝධි / මානවම්ම)

(12) පළමුවන සේන රජුගේ කාලයේ ශ්‍රී ලංකාව ආක්‍රමණය කළේ. ............................................ නම් පාණ්ඩ්‍ය රජු ය. (ආර්යචක්‍රවර්ති / ශ්‍රී මාර ශ්‍රී වල්ලභ)

(13) අනුරාධපුර යුගයේ මුල් කාලයේ ගම් පාලනය කළ පිරිස ................................ නමින් හැඳින්වා ඇත. ( ග්‍රාමික / ගහපති )

(14) පැරණි මොහෙන්දජාරෝ නගරය වර්තමානයේ ........................................ පිහිටා ඇත. (ඉන්දියාවේ / පාකිස්ථානය)

(15) කාලිංග මාඝ ගෙන් ශ්‍රී ලංකාව නිදහස් කර ගත්තේ .............................. රජතුමා ය. ( දෙවන පරාක්‍රමබාහු / තුන්වන විජයබාහු )

- අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

(16) ක්‍රමයට ක්‍රමය හුවමාරු කර ගැනීමේ ක්‍රමය අතීතයේ දී හැඳින්වූයේ ............................................ ලෙසයි.

(17) පොළොන්නරුවේ පරාක්‍රම සමුද්‍රය ඉදි කළේ ............................................ රජු ය.

(18) ඓතිහාසික සීගිරිය බලකොටුව ............................................ රජතුමා විසින් තනවන ලදී.

(19) දළදා සිරිත, සිංහල බෝධි වංශය, අනාගත වංශය වැනි කෘති රචනා වූයේ ............................................ යුගයේ ය.

(20) මලිම්පිත් ක්‍රියාව ආරම්භ වන්නේ ............................................ ගෙනි.


(ලකුණු 02 x 20 = 40)

## II කොටස

සැලකිය යුතුයි

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- ඔබ විසින් පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(01) (අ) මෙහි ඇති ශ්‍රී ලංකා සිතියමේ දී ඇති අක්ෂර වලට අදාළ නම පහත සඳහන් ලැයිස්තුවෙන් තෝරා සිතියමේ අදාළ අක්ෂරය ඉදිරියෙන් ලියන්න.




1. පොළොන්නරුව
2. පාදුව
3. මිහිපේ ගන්දෙණිය බලගොතුව
4. ගම්පල
5. කෝට්ටේ
6. මහවැලි ගංගාව
7. අනුරාධපුරය
8. දඹදෙණිය

(ලකුණු 08)

(1) (අ) (1) මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?



.............................................................................................

(2) මෙම නිර්මාණය අයත් වන්නේ කුමන ශිෂ්ටාචාරයට ද?

.............................................................................................

(ලකුණු 02)

(ආ) (3) යාබද රූපයෙන් දැක්වෙන නිර්මාණය කුමක් ද?



.............................................................................................

(4) මෙය පිහිටා ඇති ඓතිහාසික නගරය කුමක් ද?

.............................................................................................

(ලකුණු 02)

(02) අතීතයේ දී හේන්වල වී වගා කරන ලදී. හේන්වල වගා කළ වී ඇල් වී ලෙස හඳුන්වයි.

(1) හේන්වල වගා කරන ලද ඇල් වී වර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(2) A අස්වැන්න ලබා ගන්නා තෙක් හේන් රැකබලා ගැනීමට ගොවියන් අනුගමනය කළ ක්‍රියා මාර්ග දෙකක් ලියන්න.

B වී වගාව හැර හේන්වල වගා කළ වෙනත් බෝග වර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) A අතීත ලංකාව වෙළඳ සම්බන්ධතා පැවැත් වූ රටවල් තුනක් නම් කරන්න.

B විදේශයන් ගෙන් මෙරටට ගෙන්වා ගත් භාණ්ඩ වර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 05)

(03) (1) අනුරාධපුර රාජධානි සමයේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දියුණුව සඳහා රෝහල් ඉදිකළ රජවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

(2) A අනුරාධපුර යුගයේ මෙරට පාලනය කළ රජ පෙළපත් දෙක නම් කරන්න.

B රාජ්‍ය පාලනයේ දී රජුට සහාය වූ නිලධාරීන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 04)

(3) "මානවම්ම රජතුමා බලයට පත්වීම ලංකා ඉතිහාසයේ වැදගත් සිදුවීමක් ලෙස සලකයි" එය කරුණු දෙකකින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) (1) අනුරාධපුර යුගය පසු භාගයේ ශ්‍රී ලංකාවට සෘජු බලපෑම් ඇති කළ දකුණු ඉන්දීය රාජ්‍යයන් තුන නම් කරන්න. (ලකුණු 03)

(2) A පළමුවන විජයබාහු රජතුමාගේ මව හා පියා සඳහන් කරන්න.

B පළමුවන විජයබාහු රජතුමා පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(3) නිශ්ශංක මල්ල රජතුමා ජනතා සුබ සිද්ධිය වෙනුවෙන් ඉටු කරන ලද සේවාවන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(05) (1) ස්පෘශ්‍ය උරුමයන් සඳහා උදාහරණ තුනක් ලියන්න. (ලකුණු 03)

(2) අතීතයේ සිට පවත්වාගෙන යනු ලබන සම්ප්‍රදායික කලා ශිල්ප හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) පැරණි හින්දු පොත්වල සඳහන් ජීවිත චාරිත්‍ර කිහිපයක් පහත දැක්වේ. ඒවා කුමන අවස්ථාවන් හා සම්බන්ධ වේ දැයි සඳහන් කරන්න.

A - ජාත කර්ම

B - නාමකරණ

C - කර්ණවේධ

D - අන්නප්‍රාශන

E - විද්‍යාරම්භ (ලකුණු 05)

(06) (1) අනුරාධපුරය හා පොළොන්නරුව රාජධානි බිඳවැටීමෙන් පසු පාලන මධ්‍යස්ථාන බවට පත් කර ගත් ස්ථාන තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(2) දෙවන පරාක්‍රමබාහු රජතුමාගෙන් සිදු වූ සේවාවන් දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(3) කෝට්ටේ රජ කළ හයවන පරාක්‍රමබාහු රජතුමා ශ්‍රී ලංකාව එක්සත් කළ ආකාරය කරුණු දෙකකින් විස්තර කරන්න. (ලකුණු 05)

(07) (1) ග්‍රීසියේ බිහි වූ දාර්ශනිකයන් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

(2) A ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලොවට උරුම වූ දායාද දෙකක්.

B ග්‍රීක පාලන ක්‍රමයේ විශේෂ ලක්ෂණ දෙකක් බැගින් ලියන්න. (ලකුණු 04)

(3) රෝමයේ පාලනය කළ ඔගස්ටස් සීසර්ගේ වැදගත්කම පිළිබඳව කරුණු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)